රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

## 2025-07-01 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. අ.පො.ස. (උසස් පෙළ) විභාගය ඉහළින් සමත් වූ සිසුන් හට සිය ප්‍රථම උපාධිය විදේශීය විශ්වවිද්‍යාලවල හැදෑරීම සඳහා අවස්ථාව සලසා දීමේ ශිෂ්‍යත්ව වැඩසටහන**

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව "ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක්" නිර්මාණය කිරීමේ අරමුණ යථාර්ථවත් කිරීම උදෙසා අ.පො.ස. (උසස් පෙළ) විභාගය ඉහළින් සමත් වූ සිසුන් හට සිය ප්‍රථම උපාධිය ජාත්‍යන්තර ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත විදේශීය විශ්වවිද්‍යාලවල හැදෑරීම සඳහා අවශ්‍ය ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස 2025 අයවැය යෝජනාවක් මඟින් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන වෙන් කර තිබේ. මෙම ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ අන්තර්ජාතික විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් දර්ශකයන්හි පළමු ස්ථාන 500 අතර පවතින, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් සිදුකෙරෙන විදේශීය විශ්වවිද්‍යාල වෙතින් උපරිම වසර 04ක් සඳහා උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට යෝජිතය. එම වැඩසටහන මඟින් පස් අවුරුදු සැලැස්මක් යටතේ සිසුන් 200ක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇති අතර, එහි ප්‍රථම අදියර යටතේ 2025 වසර සඳහා සිසුන් 20ත් 50ත් අතර සංඛ්‍යාවක් තෝරා ගැනීමට අපේක්ෂිතය. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රධාන විෂය ධාරාවන් යටතේ ඉහළම ඉසෙඩ් අගය (z - score) සහිත සිසුන්ට මේ සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලබයි. එකී අයදුම්පත් අතරින් සුදුසු සිසුන් තෝරාගැනීම විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගෙන් සහ ආචාර්යවරුන්ගෙන් සමන්විත ප්‍රවීණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව, යෝජිත ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**02. 2026 වර්ෂය සඳහා වන අයවැය සකස් කිරීම**

"නිෂ්පාදන ආර්ථිකයක් සහ සෑම දෙනාම ආර්ථික සංවර්ධනයට දායක කර ගැනීම" යන තේමාව පදනම් කර ගනිමින් 2026-2030 රාජ්‍ය මූල්‍ය රාමුව හා රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ ජාතික ප්‍රතිපත්ති රාමුව වන " සෞභාග්‍යමත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති රාමුවට අනුගතව 2026 වර්ෂය සඳහා වන අයවැය සකස් කිරීමට අපේක්ෂිතය. 2026 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ඇතුළත් ප්‍රමුඛතාවන් සහ ග්‍රාමීය සංවර්ධන මූලාරම්භයන් කෙරෙහි මූලිකත්වයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය

163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කළමනාකරණ පනතේ විධිවිධානයන්ට සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව අමාත්‍යාංශ විෂය පථයන් යටතේ ඒ ඒ අමාත්‍යාංශ විසින් හඳුනාගනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීම සඳහා සියලුම අමාත්‍යාංශ වෙතින් යෝජනා ලබා ගැනීමට නියමිතය. ඒ අනුව, 2026 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත 2025 ඔක්තෝබර් මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර දෙවන වර කියවීම (අයවැය කථාව) 2025 නොවැම්බර් මාසයේදී සිදු කිරීමටත්, තෙවන වර කියවීමේ අයවැය විවාදය 2025 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී පැවැත්වීමටත් හැකි වන අයුරින් 2026 වර්ෂය සඳහා වන අයවැය සකස් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. කොරියානු ජනරජයේ කෘෂිකර්මාන්ත සහ ධීවර කටයුතු සඳහා සෘතුමය ශ්‍රමිකයින් යෙදවීමේ වැඩසටහන

කොරියානු ජනරජයේ E-8 වීසා කාණ්ඩය (සෘතුමය සේවකයින්) යටතේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යෙදවීම පහසු කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට 2025-02-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම සඳහා කොරියානු ජනරජයේ උනන්දුවක් දක්වන පළාත් පාලන ආයතන සමඟ රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ සාකච්ඡා පවත්වා ඇත. කොරියානු ජනරජයේ යොන්ග්වෝල් පළාත් පාලන ආයතනය සමඟ පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් දෙපාර්ශ්වය අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමට යෝජනා වී ඇත. යෝජිත අවබෝධතා ගිවිසුම මඟින්, ශ්‍රී ලාංකිකයින්ට සෘතුමය ශ්‍රමික වැඩසටහන යටතේ කෙටි කාලයක් (මාස 5 සිට 8 දක්වා) යොන්ග්වෝල් පළාතේ කෘෂිකාර්මික හා ධීවර ගම්මානවල සේවය කර ආදායමක් උපයා ගැනීමට සහ මෙරටට විදේශ විනිමය උපයා දීමට අවස්ථාව සැලසෙනු ඇත. යෝජිත අවබෝධතා ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, යොන්ග්වෝල් පළාත් පාලන ආයතනය සමඟ අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. ප්‍රජා ඵලදායී ආදර්ශ ගම්මාන වැඩසටහන

Clean Sri Lanka ජාතික ව්‍යාපෘතියට සමගාමීව එහි අරමුණු දීප ව්‍යාප්තව සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික මෙවලමක් වශයෙන් 2025, 2026 සහ 2027 වර්ෂයන්හිදී සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්ම එක් ගමක් (පවුල් 50ක් ආසන්න වශයෙන් පදිංචි) බැගින් තෝරා ගෙන සහභාගීත්ව ග්‍රාමීය ප්‍රවේශය පදනම් කර ගනිමින් ප්‍රජා ඵලදායී ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. මෙම වැඩසටහන මඟින් අධ්‍යාපනය, ආර්ථිකය, සෞඛ්‍ය හා

සනීපාරක්ෂාව, ගෘහස්ථ කළමනාකරණය හා සමාජ යහපැවැත්ම, සංස්කෘතිය හා අධ්‍යාත්මික සංවර්ධනය සහ පාරිසරික සංරක්ෂණය යන ක්ෂේත්‍රයන් යටතේ හඳුනා ගනු ලබන ආදර්ශ නිර්ණායක මත පදනම්ව, තෝරා ගනු ලබන ගම්, ප්‍රජා ඵලදායි ආදර්ශ ගම්මාන වශයෙන් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහයෝගයෙන් යෝජිත වැඩසටහන සඳහා සුදුසු ගම් තෝරා ගැනීම තෝරාගනු ලබයි. එලෙස තෝරා ගනු ලබන සෑම ගමක්ම නියෝජනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු රේඛීය අමාත්‍යාංශවලට අයත් සියලු ක්ෂේත්‍ර නිලධාරීන් බලගන්වමින් ඔවුන් හරහා ගමේ ජනතාවගේ අවශ්‍යතාවන් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සම්පූර්ණ කිරීම මෙම වැඩසටහන යටතේ අපේක්ෂිතය. ඒ අනුව, යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ විධිවිධාන පරිදි සකස් කරන ලද "ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" සඳහා 2019-10-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී තිබේ. එම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා ළමා ආරක්ෂණය හා සම්බන්ධ විෂය ක්ෂේත්‍ර දහයක් (10) ආවරණය වන සේ ඒ වෙනුවෙන් කටයුතු කරනු ලබන පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන "ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම" සකස් කරනු ලැබ ඇත. ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි "සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක්" සඳහා වූ ප්‍රතිපත්තිමය බැඳියාවන්ට සියලු ආකාරයෙන් අනුගත වන පරිදි බහුආංශික ප්‍රවේශයකින් සමන්විතව මෙම පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබේ. ඒ අනුව, එම ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. නෙදර්ලන්තයේ පවතින ශ්‍රී ලාංකේය ප්‍රභවයක් සහිත පුස්කොළ එකතුව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

නෙදර්ලන්තයේ ලන්දේසි පර්යේෂණ කවුන්සිලය විසින් යටත්විජිත සංදර්භයක් සහිත එකතුන් පිළිබඳ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන ලෙස සිදු කළ අන්තර්ජාතික යෝජනා කැඳවීමකට අනුව ඉදිරිපත් කරන ලද යෝජනාවක් මත පදනම්ව, ශ්‍රී ලාංකේය ප්‍රභවයක් සහිත නෙදර්ලන්තයේ පුස්කොළ එකතුන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ලේඛනාරක්ෂක

දෙපාර්තමේන්තුවට, නෙදර්ලන්තයේ නිදහස් විශ්වවිද්‍යාලය ඇතුළුව පාර්ශ්වකරුවන් පස්දෙනෙකු සමඟ යුරෝ 384,248ක තරගකාරී ප්‍රදානයක් දිනා ගැනීමට හැකි වී ඇත. "Whose Knowledge, Whose Values? Palm Leaf Manuscripts and the Question of Colonial Collections in Dutch Heritage Institutions" යන ප්‍රධාන මාතෘකාව යටතේ 2025 සිට 2029 දක්වා කාලය තුළ යෝජිත පර්යේෂණය සිදු කිරීමට අවස්ථාව සැලසී තිබේ. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ පාර්ශ්වකරුවන් හයදෙනා අතර අත්සන් තැබීමට නියමිත ගිවිසුමට නීතිපතිගේ නිෂ්කාශනය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ නිර්දේශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාව ලැබී ඇත. ඒ අනුව, යෝජිත ගිවිසුමට අත්සන් තැබීමටත්, 2025 - 2029 කාලසීමාව තුළ එකී පර්යේෂණය සිදු කිරීමටත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. රාජ්‍ය ණය කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම - (විෂය අංක 26)

රාජ්‍ය ණය කළමනාකරණය කිරීම පිණිස අවශ්‍ය වන ණය කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් මිල දී ගැනීම සඳහා සෘජු ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙතින් ලංසුවක් ලබා ගැනීම පිණිස 2024-10-14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙතින් ලංසුවක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ලංසු ඇගයීම් කමිටුව සහ ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් බ්‍රිතාන්‍ය පවුම් 12,500ක වාර්ෂික නඩත්තු ගාස්තුවක් යටතේ Commonwealth Meridian මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත පිරිනැමීම නිර්දේශ කර තිබේ. ඒ අනුව, එකී මෘදුකාංගය හා ආශ්‍රිත සේවාවන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. ශ්‍රී ලංකා එක්ස්පෝ ප්‍රදර්ශනය - 2026

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 1992, 1994, 1997 සහ 2012 වසරවලදී ශ්‍රී ලංකා එක්ස්පෝ ප්‍රදර්ශනය පවත්වා තිබේ. වසර 14කට පසුව නැවත 2026 වර්ෂයේදී කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී ශ්‍රී ලංකා එක්ස්පෝ ප්‍රදර්ශනය 2026-06-18 සිට 21 දින දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ සඳහා, අපනයනකරුවන්, අපනයනට සූදානම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගැනුම්කරුවන් සහ ආයෝජකයින් ඇතුළු 1,500ක් දෙනා ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, ශ්‍රී ලංකා

එක්ස්පෝ ප්‍රදර්ශනය - 2026 ජාතික උත්සවයක් ලෙස සංවිධාන කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. දිවයින පුරා නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම

එදිනෙදා නාගරික ප්‍රදේශ කරා ඇදී එන මහජනතාව සහ දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා නිසි ප්‍රමිතියෙන් යුත් භාවිතයට ගත හැකි සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, ප්‍රමිතියෙන් යුත් වැසිකිළි පද්ධතිවලින් සමන්විත සනීපාරක්ෂක පහසුකම් ඉදි කිරීමට රජය විසින් තීරණය කරනු ලැබ ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් යෝජිත පහසුකම් ස්ථාපනය කළ යුතු උචිත ස්ථාන නාගරික සංවර්ධන සැලසුම්වලට අනුව හඳුනාගනු ලැබ තිබේ. එම ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂක පහසුකම් පද්ධති 20ක් ඉදි කිරීමට යෝජිත අතර, ඒ සඳහා රුපියල් මිලියන 525.29ක් වැය වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත. ඒ අනුව, පහත සඳහන් ස්ථානවල යෝජිත සනීපාරක්ෂක පහසුකම් පද්ධති ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* දෙමෝදර දුම්රිය ස්ථානය
* සීගිරිය හෝටල් මංසන්ධිය
* නුවර වැවරවුම
* ග්‍රෙගරි වැව, නුවරඑළිය
* කින්නියා වෙරළ, ත්‍රිකුණාමලය
* මාබල් බීච්, ත්‍රිකුණාමලය
* නිලාවෙළි වෙරළ ප්‍රදේශය, ත්‍රිකුණාමලය
* පාසිකුඩා, මඩකලපුව
* රුවන්වැලිසෑය රථගාල පරිශ්‍රය
* ලංකාපුර, පොළොන්නරුව
* යාපනයේ කුරිකඩ්ඩුවාන් ජැටි පරිශ්‍රය
* හික්කඩුව වෙරළ තීරය

* හිරිකැටිය, දික්වැල්ල
* පරෙයිවැල්ල වෙරළ උද්‍යානය, තංගල්ල
* ආරුක්කු නාවය පාලම, ඇල්ල
* මොරගොල්ල වෙරළ, බේරුවල
* ගල්කිස්ස දුම්රිය ස්ථානය
* මීගමුව වෙරළ උද්‍යානය ව්‍යාපෘතිය, අදියර 1
* බත්තරමුල්ල මංසන්ධිය
* බඩගමුව වන උද්‍යානය, කුරුණෑගල

10. **අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා වන රජයේ ආධාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන නිවාස වැඩසටහනේ අධීක්ෂණ කටයුතු සඳහා උපදේශන ආයතන තෝරා ගැනීම**

අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා වන රජයේ ආධාර වැඩසටහන යටතේ ඉදිකරන නිවාස ඒකක 1,996ක නේවාසික වැඩබිම් අධීක්ෂණ කටයුතු සඳහා පැකේජ 03ක් යටතේ උපදේශන ආයතනයන් තෝරා ගැනීම පිණිස නාගරික සංවර්ධන අධිකාරිය විසින් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා තිබේ. ඒ සඳහා ආයතන 06ක් අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කර ඇති අතර, ඉන් ආයතන 03ක් පමණක් යෝජනා සඳහා ඉල්ලීම් (RFP) ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබා ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශකවරුන් තෝරාගැනීමේ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, පහත සඳහන් පරිදි අදාළ උපදේශක සේවා සපයා ගැනීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

පැකේජ 1 - මොරටුවේ නිවාස ඒකක 575ක් සහ කොට්ටාවේ නිවාස ඒකක 108ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත පිරිනැමීම.

පැකේජ 2 - දෙමටගොඩ නිවාස ඒකක 586ක් සහ මහරගම නිවාස ඒකක 112ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනැමීම.

පැකේජ 3 - පැලියගොඩ නිවාස ඒකක 615ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත පිරිනැමීම.

11. **රජයකින්-රජයකට පදනම යටතේ අවශ්‍ය අවස්ථාවන්වලදී ඖෂධ හා වෛද්‍ය උපාංග මිල දී ගැනීමේ ක්‍රමවේදය**

රජයකින්-රජයකට පදනම යටතේ හිඟ ඖෂධ ලබා ගැනීම පිණිස විභව හැකියාවක් සහිත රටවල් තෝරා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම පිණිස ජ්‍යෙෂ්ඨ නිලධාරි කමිටුවක් පත් කිරීමට 2025-05-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, එම කමිටුව විසින් සකස් කරනු ලැබ ඇති කෙටුම්පත් ක්‍රමවේදය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යොමු කර, එම කොමිෂන් සභාවේ යෝජනා සහ නිරීක්ෂණ මත පදනම්ව රජයකින්-රජයකට යන පදනම යටතේ ඖෂධ හා වෛද්‍ය උපාංග මිල දී ගැනීම සඳහා වන ක්‍රමවේදයක් සකස් කර ඇත. එම ක්‍රමවේදය අනුව අත්‍යවශ්‍ය අවස්ථාවලදී ඖෂධ හා වෛද්‍ය උපාංග මිල දී ගැනීම සඳහා විභවයක් සහිත රටවල් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීමටත්, එම රජයන් විසින් නම් කරනු ලබන ආයතන හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව නියමිත පරිදි ගිවිසුම්ගත වී සාමාන්‍ය සැපයුම්දාම ඔස්සේ සපයා ගැනීමට අපහසු ඖෂධ හා වෛද්‍ය උපාංග සපයා ගැනීමටත් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **අන්තඃඅක්ෂි කාච සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය**

ඇසේ සුද ඉවත් කිරීම හෝ මයෝපියාව සම්බන්ධ ප්‍රතිකාරවලදී ඇසට බද්ධ කිරීම සඳහා භාවිත කරනු ලබන අන්තඃඅක්ෂි කාච වර්ග 05ක් සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසුකරුවන් 05 දෙනෙකු විසින් ලංසු ඉදිරිපත් කර ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, අදාළ අන්තඃඅක්ෂි කාච වර්ග 05 පහත සඳහන් සැපයුම්කරුවන් වෙතින් ප්‍රසම්පාදනය කර ගැනීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* එස් ආර් අංක 13005029 සහ 13005032 දරන ප්‍රසම්පාදනයන්ට අදාළ සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවේ M/s Elshaddai Enterprises (Pvt) Ltd. වෙතින් අන්තඃඅක්ෂි කාච සපයා ගැනීම.

* එස් ආර් අංක 13005026, 13005031 හා 13005030 දරන ප්‍රසම්පාදනයන්ට අදාළ සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවේ M/s Jayasuriya Associates වෙතින් අන්තඃඅක්ෂි කාච සපයා ගැනීම.

13. **සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම පද්ධතිය) නියෝග සංශෝධනය කිරීම**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ විධිවිධාන මඟින් සාමදාන විනිශ්චයකාරවරයෙකුගේ ධුරයේ පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ අවසන් කිරීම සඳහා රෙගුලාසි පැනවීමට අමාත්‍යවරයාට බලය පවරනු ලැබ තිබේ. ඒ අනුව, අංක 2360/22 දරන 2023-11-27 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් 2023 අංක 3 දරන සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම පද්ධතිය) නියෝග ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග සංශෝධනය කරමින් සංශෝධිත නියෝග අංක 2439/34 දරන 2025-06-04 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇත. එකී නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම සහ සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම තුළ පසුගිය කාලයේ දී සිදුවී ඇති වංචා, දූෂණ හා අක්‍රමිකතා සෙවීම සඳහා ජනාධිපති විශේෂ විමර්ශන කමිටුවක් පිහිටුවීම**

සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම මඟින් රටේ ආර්ථික අභිවෘද්ධිය සඳහා දායකත්වයක් සැපයුව ද එය පවත්වාගෙන යාම සඳහා රජයට අධික වැය බරක් දැරීමට සිදුව ඇති අතර, එම සමාගම වාර්ෂිකව ලබන අධික පාඩුව රටේ ආර්ථිකයට දරා ගැනීමට අපහසු වී ඇත. මෙම සමාගම ආර්ථිකමය වශයෙන් වාසිදායක, කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය ආයතනයක් බවට පත් කර, නවීන තාක්ෂණය භාවිත කරමින් සාර්ථක ලෙස පවත්වාගෙන යාම මහජන අභිලාෂය වී තිබේ. ඒ සඳහා, සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම වර්තමාන තත්ත්වයට පත් වීමට බලපෑ හේතු සම්බන්ධයෙන් පසුගිය කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳ විධිමත් අධ්‍යයනයක් හා ඇගයීමක් සිදු කළ යුතුය. එසේම, ගුවන්තොටුපොළ මෙහෙයුම් සම්බන්ධයෙන් වගකීම පැවරී ඇති සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ කටයුතු පිළිබඳව ද විමර්ශනය කිරීමේ අවශ්‍යතාව විවිධ පාර්ශ්වයන් ඔස්සේ රජයේ අවධානයට යොමු කර ඇත. ඒ අනුව, 2010-2025 කාලසීමාව තුළ ඉහත සඳහන් ආයතනවල සිදු වී ඇතැයි සැලකෙන වංචා, දූෂණ සහ අක්‍රමිකතා සොයා බලා නිර්දේශ සහිත සවිස්තරාත්මක

වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා හිටපු විගණකාධිපති එච්.එම්.ගාමිණී විජේසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුත් ජනාධිපති විශේෂ විමර්ශන කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

***********